# ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය තුළින් සමාජ ඒකාබද්ධතාව

කේ. ඒ. එන්. පුෂ්පකුමාර[1]

## හැඳින්වීම


සමාජ ඒකාබද්ධතාව (Social cohesion) යන වචනය වර්තමානයේ බොහෝ ක්ෂේත්‍රයන් ආශ්‍රිතව භාවිත වන ආකාරය දැකිය හැකිය. එහෙත් එම වචනය මගින් නියමාකාර අර්ථය පිළිබිඹු වීමක් දක්නට නොලැබේ.ජෙන්සන්ට (Jensen,1998) අනුව සමාජ ඒකාබද්ධතාව යනු සමාජ ක්‍රමයක් තුළ සියලු සාමාජිකයින් පොදු නීතිරීතිවලට ගරු කරමින් හා එකිනෙකාට ගරු කරමින් වෙනස්කම් දරා ගැනීම වේ.

ආර්ථික සහයෝගීතාව හා සංවර්ධනය පිළිබඳ සංවිධානයට (OECD,2001) අනුව පොදු අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා වෙනස්කම් සහිත කණ්ඩායම් තම වෙනස්කම් පිටු දැකීම සමාජ ඒකාබද්ධතාව ලෙස හඳුන්වා දෙයි.
රිට්සන්ට (Ritzen,2001) අනුව සමාජය තුළ ජීවත් වන සියලු සාමාජිකයින්හට සමාන ඉඩ ප්‍රස්තා ඇති කිරීමට සූදානම්වීම හා ඒ කෙරෙහි කැපවීමත්, සහයෝගයෙන් යුතුව ඒ සඳහා සහය දැක්වීමත් තුළින් සමාජ ක්‍රමය තුළ සමානාත්මතාව තහවුරු කිරීම වේ.

අතීතයේදී සමාජ ඒකාබද්ධතාව ලෙස සලකන ලද්දේ විවිධ සංස්කෘතික, ආගමික කණ්ඩායම් එක් ජාතියක් ලෙස පොදු භාෂාවක්, පොදු ආගමක් මෙන්ම පොදු අගය පද්ධතියක් තුළට ඒකරාශී කිරීම වේ. (The promotion of Social Cohesion through Education in Sri Lanka, 2011) හේනිමාන් (Heyneman, 2010) පෙන්වා දෙන පරිදි වර්තමානයේ සමාජ ඒකාබද්ධතාව යන්නෙන් අදහස් කරනු ලබන්නේ සමග්‍රහණය කිරීම වෙනුවට සියලු වාර්ගික කණ්ඩායම්,ආගමික කණ්ඩායම් පූර්ණ නිදහසක් බුක්ති විඳිමින් තම අනන්‍යතාව එයාකාරයෙන්ම බුක්ති විඳීමට ඉඩ ප්‍රස්තා සැලසීමත්, එමගින් එක් ජාතියක් වශයෙන් නැගීසිටීමට අවස්ථාව උදා කිරීමත් වේ.
සමාජ ඒකාබද්ධතාව ප්‍රධාන මානයන් පහකින් සමන්විත වන බව ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය තුළින් සමාජ ඒකාබද්ධතාව ප්‍රවර්ධනය කිරීම (The promotion of Social Cohesion through Education in Sri Lanka, 2011) පිළිබඳ වාර්තාව පෙන්වා දෙයි.

---

1 අධ්‍යාපන දර්ශනපති/දර්ශනශූරී උපාධි පාඨමාලාව (පූර්ණකාලීන), අධ්‍යාපන පීඨය, කොළඹ විශ්ව විද්‍යාලය, කොළඹ.




(The promotion of soci
cohesion through
Education in Sri
Lanka,2011)

අධ්‍යාපනය තුළින් සමාජ ඒකාබද්ධතාව ප්‍රවර්ධනය කිරීම පිළිබඳ ( The Promotion of Social Cohesion Through Education in Sri Lanka, 2011) වාර්තාවට (2011) අනුව සමාජ ඒකාබද්ධතාව ඇති කිරීමේ ප්‍රධාන මානයන් කිහිපයක් වේ.විෂයමාලාව (Curriculum), ගුරු අධ්‍යාපනය (Teacher Education), දෙවන භාෂාව ඉගැන්වීම ප්‍රවර්ධනය කිරීම (Second National Language), සමස්ත පාසල් සංස්කෘතිය වැඩිදියුණු කිරීම (Whole School Culture), පාසල් අන්තර්කරණය (Intergrated Schools) විෂය සමගාමී ක්‍රියාකාරකම් ඇති කිරීම (Co-curricular activities), පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම (Research) එම මානයන් වේ.

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව 2003 වර්ෂයේ ප්‍රකාශයට පත් කළ මානව සංවර්ධනය සඳහා අධ්‍යාපනයේ ඉදිරි දැක්මඃශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති රාමුවක් සඳහා යෝජනා (2003) මගින් පුරවැසි අධ්‍යාපනය විෂය නැවත පාසල් පද්ධතියට හඳුන්වාදීමේ අවශ්‍යතාවය පෙන්වා දී ඇත. ඒ අනුව 6 ශ්‍රේණියේ පරිසර අධ්‍යයනය, 6-9 ශ්‍රේණිවල හා 10-11 ශ්‍රේණිවල සමාජ අධ්‍යයනය හා ඉතිහාසය විෂයයන් ඉවත් කොට ඉතිහාසය, භූගෝල විද්‍යාව හා ප්‍රජාචාරය/ පුරවැසි අධ්‍යාපනය වශයෙන් අනිවාර්ය විෂයන් තුනක් 6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා ක්‍රියාත්මක කිරීමට එමගින් නිර්දේශ කරනු ලැබීය.

ශ්‍රී ලංකාවේ පාසල් විෂය මාලාවට පුරවැසි අධ්‍යාපනය විෂය හඳුන්වාදීමේ මූලික අරමුණ වූයේ සමාජ ඒකාග්‍රතාවය ගොඩනැගීම වේ. එකී පරමාර්ථය පෙරදැරි කොට ගෙන 2007 වර්ෂයේ නව විෂයමාලා ප්‍රතිසංස්කරණය යටතේ 6-9 ශ්‍රේණි සඳහා ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය ලෙස විෂය කොටස් දෙකක් හඳුන්වා දෙනු ලැබීය.නමුත් 2007 වර්ෂයේ දී ඇතිකළ ප්‍රධාන විෂයමාලා ප්‍රතිසංස්කරණය මගින් නැවත වරක් විෂයමාලාව සංශෝධනය විය.ඒ යටතේ 6-9 ශ්‍රේණි සඳහා ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය නමින් විෂයේ නම වෙනස් වූ අතර එතෙක් පුරවැසි අධ්‍යාපනය සඳහා වෙන් කර තිබූ කාලච්ඡේද සංඛ්‍යාව සතියකට එක (01) දක්වා අඩු කරනු ලැබීය.

පුරවැසි අධ්‍යාපනය විෂය පාසල් විෂය මාලාවට ඇතුළත් කිරීමේ අවශ්‍යතාවය ජාතික අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව (2003) විසින් ප්‍රකාශයට පත් කරන ලද අතර එහි ප්‍රතිඵලයක් ලෙස ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය විෂය ශ්‍රී ලංකාවේ පාසල් විෂය මාලාවට හඳුන්වා දෙනු ලබන්නේ 2005 වර්ෂයේදීය. එහි සමාජ ඒකාබද්ධතාව ඇති කිරීම සඳහා ඍජුව දායක වන ජාතික අධ්‍යාපන අරමුණු දෙකක් ඉදිරිපත් කර ඇත. එම අරමුණු දෙක වන්නේ,

> "මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයමත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාවය, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩ නැගීම සහ ශ්‍රී ලාංකික අනන්‍යතාව තහවුරු කිරීම."
>
> "මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතුව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල්වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවන් ගැබ්වූ පරිසරයක් නිර්මාණය කිරීම සහ පවත්වා ගෙන යාමට සහය වීම."

(මානව සංවර්ධනය සඳහා අධ්‍යාපනයේ ඉදිරි දැක්ම, ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති රාමුවක් සඳහා යෝජනාඃ 2003 )
තවදුරටත් ජාතික අධ්‍යාපන අරමුණු සාධනය කර ගැනීම සඳහා සපුරාලිය යුතු මූලික නිපුණතා තුනක් හඳුන්වා දෙන ජාතික අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව (2003) පරිසරයට අදාළ නිපුණතා යටතේ සමාජ පරිසරයට අදාළ අනු නිපුණතා දක්වනු ලබයි.

- ❖ බහු වාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා

අබේවික්‍රම (2010) පෙන්වා දෙන පරිදි බහුවිධ සමාජ ක්‍රමයක් තුළ ප්‍රජාචාර අධ්‍යාපනය හෙවත් පුරවැසි අධ්‍යාපනය තුළින් සිදු කරන්නේ විශාල මෙහෙයකි.

එතුළින් ඉටු කර ගැනීමට අපේක්ෂිත අත්‍යවශ්‍ය අංග තුනක් පිළිබඳව ඔහු අවධාරණය කරනු ලබයි.

1. පුරවැසි දැනුම (Civic knowledge)
2. පුරවැසි ආකල්ප (Civic attitudes/Civic disposition)
3. පුරවැසි කුසලතා (Civic skills)

ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය (6 ශ්‍රේණිය) ගුරු මාර්ගෝපදේශයට අනුව ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය යන විෂය කාණ්ඩ දෙකෙහි අරමුණු වෙන් වශයෙන් දක්වා ඇත. එහි පුරවැසි අධ්‍යාපනයට අදාළ අරමුණු 09 කි. එම අරමුණු අතුරින් පළමු අරමුණ වන්නේ බහුවිධ සමාජ ක්‍රමයක් තුළ සමාජ සමාජ ඒකාබද්ධතාවය ඇති කිරීම සඳහා අදාළ වන්නකි,

- ❖ බහුවිධ සමාජයක් තුළ එක්සත් බවින් යුක්තව ජීවත්වීමට අවශ්‍ය නිපුණතා වර්ධනය කිරීම.

සමාජ ඒකාබද්ධතාව ඇති කිරීම තුළින් නිර්මාණය කිරීමට අපේක්ෂිත අනාගත පුරවැසියා සතු ගුණාංග දහතුනක් ජාතික ප්‍රතිපත්තිය සහ ක්‍රියාකාරකම් පිළිබඳ විස්තරාත්මක රාමුව (2008) මඟින් පෙන්වා දෙනු ලබයි.එහි බහු සංස්කෘතික සමාජ ක්‍රමයක් තුළ සංස්කෘතික විවිධත්වයට ගරු කරමින් එකිනෙකා සමඟ විශ්වාසයෙන් හා දයාවෙන් යුතුව වෙනස්කම් කෙරෙහි සංවේදීව කටයුතු කරන සහ ජනවාර්ගික විවිධත්වයමත කටයුතු නොකරන විශ්වීය පුරවැසියෙකු බිහි කිරීම ප්‍රධාන අපේක්ෂාව වේ.

> "බහු සංස්කෘතික සමාජයක ජීවත් විය හැකිය. විවිධත්වය ගරු කරයි. වෙනස්කම් පාදකව තරඟ නොකරයි. අන් අයගේ සංස්කෘතීන් ඉවසීමට හැකි වන අතර ඒවා අගය කරයි. අන් අය විශ්වාස කරයි. මානව දයාවෙන් යුක්ත වෙයි. වර්ගවාදී නොවෙයි. අන්තර් සංස්කෘතික විරෝධතා පිළිබඳව තර්කානුකූලව විශ්ලේෂණය කිරීමට හැකි වෙයි."

(ජාතික ප්‍රතිපත්තිය සහ ක්‍රියාකාරකම් පිළිබඳ විස්තරාත්මක රාමුව: 2008)

පුරවැසි අධ්‍යාපනය විෂය තුළින් අපේක්ෂිත මුඛ්‍ය පරමාර්ථය වන්නේ බහු සංස්කෘතික සමාජයක් තුළ එක්සත්බවින් යුක්තව ජීවත්වීමට අවශ්‍ය නිපුණතා සිසුන් තුල සංවර්ධනය කිරීම වේ.

මේ වන විට වසර හතකට අධික කාලයක් ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතිය තුළ මෙම විෂය ක්‍රියාත්මක කරනු ලැබුවද එහි මූලික අරමුණු විෂය මාලාව තුළ

කොතෙක්දුරට අන්තර්ගතව තිබේද? සිසුන් තුළ එකී නිපුණතා සාධනය කිරීම උදෙසා ගෙන ඇති පියවර ප්‍රමාණවත්ද? ඒවා කොතෙක් දුරට සාර්ථකව වී තිබේද? යන්න පිළිබඳව විධිමත් අධ්‍යයනයක් මෙතෙක් සිදුව නොමැත.

ප්‍රජාචාර විෂය අන්තර්ගතයේ හා ක්‍රියාකාරකම්වල ඇතුළත් විය යුතු ලක්ෂණ ජාතික අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව (2003) විසින් පෙන්වා දෙයි.

❖ අන් අය සමග සහයෝගයෙන් ජීවත්වීමට ඉගෙන ගැනීම තුළින් සමාජ ඒකාබද්ධතාව සඳහා විවිධ වාර්ගික, බහු ආගමික, බහු සංස්කෘතික සමාජයක සංස්කෘතික විවිධත්වයට ගරු කිරීම.

**පර්යේෂණ අරමුණු**

සමාජ ඒකාබද්ධතාව ඇති කිරීම කෙරෙහි ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය විෂයයේ දායකත්වය පිළිබඳව විමර්ශනය කිරීමට අදාළ මෙම පර්යේෂණය තුළ මූලික අරමුණු හතරක් පදනම් කර ගෙන ඇත. එම අරමුණු වන්නේ,

1. ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය (6-9) විෂයේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට පාසල් පෙළපොත්, ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ සහ ඉගෙනුම් උපකරණවල දායකත්වය ඇගයීම.
2. ගුරුවරුන් හා සම්පත් පුද්ගලයින්ට ඇති පුහුණු අවශ්‍යතා සමීක්ෂණය කිරීම.
3. විෂයමාලාව තුළවිෂයේ සිදු කළ යුතු වෙනස්කම් හඳුනා ගැනීම.
4. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ සාර්ථකත්වය සඳහා අවශ්‍ය වෙනස්කම් හඳුනා ගැනීම.

**පර්යේෂණ ක්‍රමවේදය**

සමාජ ඒකාබද්ධතාව ගොඩ නැගීම සඳහා ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය විෂය කොතෙක්දුරට දායකත්වයක් සපයන්නේද යන්න පරීක්ෂාකව ලක් කිරීම අතිශය සමාජ විද්‍යාත්මක සංසිද්ධියක් වන අතර එවැනි තත්ත්වයක් හොඳින් අධ්‍යයනය කළ හැක්කේ විවරණීය මානව වංශ අධ්‍යයන ක්‍රමවේදය තුළින් බව පර්යේෂකයාගේ අදහසයි. එම නිසා සමාජ ඒකාබද්ධතාව වැනි අතිශය ගුණාත්මක ලක්ෂණවලින් හෙබි සංකල්පයක සාධනය තීරණය කිරීම ප්‍රමාණාත්මක පර්යේෂණ ක්‍රමවේදය භාවිතා කොට, සංඛ්‍යාත්මක දත්ත මත පදනම්ව සිදු කිරීම සාධාරණ නොවන හෙයින් **ගුණාත්මක අධ්‍යයන ක්‍රම ශිල්පය** යොදා ගැනීමට පෙළඹුණි.

### පර්යේෂණ උපකරණ

පර්යේෂණය සඳහා දත්ත එක්රැස් කිරීමේ ප්‍රධාන උපකරණ තුනක් යොදා ගැනීමට යෝජිතය. ඒවා නම්,

- ❖ අන්තර්ගත විශ්ලේෂණය (Content Analysis)
- ❖ සම්මුඛ සාකච්ඡා (Interviews)
- ❖ නිරීක්ෂණය (Observation)

### පර්යේෂණ අනාවරණ

බෞද්ධ දර්ශනය තුළ සමාජ ඒකාබද්ධතාවය ඇති කිරීම සඳහා සෑම අවස්ථාවකම කටයුතු කර ඇත. එබැවින් සිගාලෝවාද සූත්‍රය ඇසුරින් සමාජ ඒකාබද්ධතාව ඇති කිරීම සඳහා දක්වා ඇති දායකත්වය මෙම පර්යේෂණයට අදාළ සාහිත්‍ය විමර්ෂණය තුළින් හඳුනාගත හැකි විය.

### සංෂිප්තය

ශ්‍රී ලංකාව බහු සංස්කෘතික රටක් වශයෙන් විවිධ ජනවර්ග, ආගම්, භාෂාවන්ගෙන් සමන්විත වේ. එවැනි රටක සමාජ ඒකාබද්ධතාව ඇති කිරීම අත්‍යවශ්‍ය දෙයක් වන අතර අධ්‍යාපනය මගින් ඊට අවශ්‍ය පහසුකම් සැලසීම ප්‍රමුඛ කාර්යයකි. වාර්ගිකත්වය පදනම් කර ගනිමින් වසර 30ට ආසන්න කාලයක් පැවති යුධමය තත්ත්වය හේතු කොට ගෙන ශ්‍රී ලංකාවේ සමාජ ඒකාබද්ධතාව දරුණු බිඳ වැටීමකට ලක්ව ඇති තත්ත්වයක් තුළ මිනිසුන් අතර පවතින බෙදීම් නැති කොට සමාජ ඒකාබද්ධතාව ඇති කිරීම කාලීන අවශ්‍යතාවයකි. අධ්‍යාපනය තුළින් සමාජ ඒකාබද්ධතාව ඇති කිරීමේ දී ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය විෂය සඳහා ප්‍රමුඛතාව හිමිවන අතර 2007 නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යෝජනා හරහා එකී විෂය හඳුන්වාදීමේ දී ද ඒ බව පෙන්වා දී ඇත. එබැවින් ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය විෂය, සමාජ ඒකාබද්ධතාවය ඇති කිරීම සඳහා දක්වන දායකත්වය කෙබඳුද යන්න මූලික අරමුණු හතරක් හා පර්යේෂණ ප්‍රශ්ණ හතරක් ඔස්සේ ගුණාත්මක පර්යේෂණ ප්‍රවේශය භාවිතයට ගනිමින් අධ්‍යයනයට ලක් කිරීම මෙම පර්යේෂණය මගින් සිදු කරනු ලැබේ. ඉන් පළමු අරමුණට අදාළව විෂය හඳුන්වා දීම සඳහා බලපාන ලද සාධක හා ඉන් අපේක්ෂිත අරමුණු කවරේද යන්න පිළිබඳව සාහිත්‍ය විමර්ශනය ඇසුරින් කරුණු අනාවරණය කර ගැනීම සිදු කළ අතර ඉන් තහවුරු වූයේ බෞද්ධ දර්ශනය තුළ සමාජ ඒකාබද්ධතාවය ඇති කිරීම සඳහා සෑම අවස්ථාවකම කටයුතු කර ඇති බවයි. එබැවින් සිගාලෝවාද සූත්‍රය ඇසුරින් සමාජ ඒකාබද්ධතාව ඇති කිරීම සඳහා දක්වා ඇති දායකත්වය පෙන්වා දීම මෙමගින් සිදු කෙරේ.

වශයෙන් නොගෙන පුද්ගලයා ලබන උසස් සාහිත්‍ය කලා රස වින්දනය බුදු සමය අනුව සහිත්‍ය කලා තුළින් ලැබිය හැකි ගැඹුරු රසවින්දනය යි.

**ප්‍රමුඛ පදඃ** බුදුදහම, සාහිත්‍යය, සාහිත්‍ය රසවින්දනය

**ආශ්‍රිත ග්‍රන්ථ**

සූරවීර, ඒ. වී. (1991). *සාහිත්‍ය විචාර ප්‍රදීපිකා.* ප්‍රදීප ප්‍රකාශකයෝ, පිටුව 120.
*අංගුත්තර නිකාය, තිකනිපාත,* (1960). බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා. පිටුව 464.
*සංයුත්ත නිකාය,* සලායතන සංයුත්ත, ලෝක සුත්ත, (1981) බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා. පිටුව 118.
*සංයුත්ත නිකාය,* පිහින සූත්‍රය, (1960) .බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා. පිටුව 76.
*අංගුත්තර නිකාය,* ඒකක නිපාත, (1960). බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා. පිටුව 76.
*සංයුත්ත නිකාය,* දේවතා සංයුත්තය, නසන්ති සූත්‍රය, (1960). බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා. පිටුව 42.